(All Rights Reserved)


01. පහත දී ඇති ඡේද ඇසුරින් අසා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට වර්තමාන ලිඛිත බසින් ම පිළිතුරු සැපයිය යුතු යි.

(අ) එසඳ පන්සියයක් පසේබුදුවරයෝ ආකාශයෙන් අවුත් මහ විසල් මළුවට බට සේක. එකෙණෙහි බල ඇත්තු දෙදෙනෙක් ඇත්රජ්ජුරුවන්ගේ ශරීරය දළින් ඔසවා පසේබුදුවරයන් වඳවා දර සෑයට වැඩූහ. පසේබුදුහු තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි ආදාහන ස්ථානයෙහි ඉඳ පිරිත් බිණූ සේක.

අටදහසක් ඇත්තු ද ආදාහන ස්ථානයෙහි ගිනි නිවා අළු අස් කොට සුභද්‍රා නම් ඇතින්නිය පෙරටු කොට ලා තමන් වසන ස්ථානයට ම හඬමින් වැලපෙමින් ගියාහ. සෝණුත්තර නම් වැදිපුත්‍ර ද ලොව අනික් ඇත් කෙනෙකුට නැති හෙයින් ආශ්චර්යවත් වූ ඒ දළ දෙක්හි රන්වන් වූ රැසින් හාත්පසින් වන ලැහැබ බබුළුවා සත් දවසක් ඇතුළත ම බරණැස් නුවර සමීපයට පැමිණ 'මම ඡද්දන්ත නම් ඇත්රජහුගේ සවනක් රැසින් බබළන්නා වූ දළ දෙක ගෙනාමි. නුවර සැරහුව මැනවැ' යි බිසවුන්ට කියා යවා උන් විසිනුත් රජ්ජුරුවන්ට කියා නුවර සැරහූ කල්හි සෝණුත්තර වැදි තෙමේ නුවරට වැද ප්‍රාසාදයට නැඟී දළ දෙක බිසවුන්ට දී කියනුයේ 'බිසවුන් වහන්ස, නුඹ වහන්සේට පූර්ව ජාතියෙහි ස්වාමි වූ ඇත්රජ්ජුරුවන් කළ වරදක් සිත්හි තබා වෛර බැඳ මරන්ට සිතූ පරිද්දෙන් මළ නියාව දත මැනව. මේ ඔහුගේ දළ වේ දැ' යි දුන්නේ ය.

i. **හඬමින්, ආශ්චර්යවත්** යන පදවල ව්‍යාකරණ ලක්ෂණ දක්වන්න.
ii. ඡද්දන්ත ඇතුගේ ආදහනය සිදු කළේ කෙසේ ද?
iii. සෝණුත්තර වැදි තෙමේ චුල්ල සුභද්‍රාවන්ට දළ දෙක ලබා දුන්නේ කෙසේ ද?
iv. **සවනක් රැසින්, සැරහුව, ප්‍රාසාදය** යන පදවල අර්ථ ලියන්න.

(ආ) මෙසේ මඬුවා කී බස් අසා රජ්ජුරුවන් හා පුරෝහිත බමුණා හා දෙන්නා ඔවුනොවුන් හා කථා කොට 'වල වසන තිරිසනුන් පටන් කොට සියල්ලෝ ම අපට පරිභව බෙණෙති' යි කියා එතැනින් වැළක නුවරට ගොස් එතැන් පටන් දශරාජධර්මයෙන් රාජ්‍යය කොට බෝධිසත්ත්වයන්ගේ අවවාදයෙහි පිහිටා දානාදී සුචරිතයෙහි යෙදී සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කොට විසූහ' යි භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ කොසොල් රජ හට මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා වදාරා 'මහ රජ්ජුරුවෙනි, රජදරුවන් විසින් නම් සතර මහාද්වීපයෙහි එක පැහැර වස්නා චාතුද්වීපික මහා මේඝයක් මෙන් සියලු සත්ත්වයන් කෙරෙහි සර්වසාධාරණ ව පැවැත රාජ්‍යය කට යුතු ය' යි වදාරා, මේ ජාතකය පූර්වාපර සන්ධි ගළපා නිමවා වදාළ සේක.

i. **ඔවුනොවුන්, විසූහ** යන පදවල ව්‍යාකරණ ලක්ෂණ දක්වන්න.
ii. මඬුවා කී බස් අසා රජු හා පුරෝහිත බමුණා පිවිසියේ කොතැනට ද?
iii. බුදුරජාණන් වහන්සේ කොසොල් රජ හට පැවසූ පරිදි සර්ව සාධාරණ ව රාජ්‍ය කටයුත්තේ කෙසේ ද?
iv. **ජනරඤ්ජනය කොට, පූර්වාපර සන්ධි ගළපා, එකපැහැර** යන පදවල අර්ථ දක්වන්න.

(ඇ) ක්ලේශගත ව තමා අත ගත් රාක්ෂසයා විසින් පෙළන ලද, සතුරා වසඟයට පැමිණි බිසව් තමාගේ වල්ලභයා ම සිතා සෝකයෙන් හඬන්නී මෙසේ කියාඃ 'යම් බඳු වූ මේ රාක්ෂසයා මා අල්වාගෙන අත්පා උණ කිලිල්ලක් සේ කඩා කන්නේ වී නමුත් ඒ මට දුක් නො වෙයි. වැළි දුක් කවරේ ද යත හොත්ඃ මෙතෙක් වේලා මා නො ගියේ ය යි රජ්ජුරුවන් සිතන කල සම්බුලාවෝ රාජසුඹුමාලයෝ ය; බලා ඇස් ඇදගත නො හැකි තරම් රූ ඇත්තෝ ය; බොහෝ දවසක් මට දුක් ගත් හෙයින් කනස්සලු ව රෝගයෙන් පීඩිත මා හැර අන් පුරුෂයෙකු හා සමඟ ලෝකාස්වාදරතියෙන් ප්‍රමාද ව මා අත අළුවාහු වනැයි සිතූ සේක් වී නම් ඊට වඩනා දුකෙක් මට නැත්තේ ය' යි මෙලෙස කියා තව ද ලෝකපාල දෙවියන්ට උජ්ඣායනා කොට අඬන්නී මෙලෙස කියාඃ 'ඒකාන්තයෙන් ලෝකපාල දෙවි කෙනෙක් ලොව නැත්තාහ. ඔහු මේ සක්වළ හැර පරසක්වළකට ගියාහු වන.

මේ ලෝකයෙහි ලෝකපාල දේවතා කෙනෙක් ඇත් නම් මේ ජාතියට වල්ලභයා හැර රාගචිත්තයෙන් අන්‍ය පුරුෂයෙකු මුහුණ නො බැලූ, ලේඩිත්තක විචරත් ප්‍රාණඝාතයක් නො කළ, මුසාවාදාදි දෝෂයෙන් වැළකී පතිව්‍රතාධර්මයෙහි පිහිටි මා වැනියකට මේ රාක්ෂසයා කරන දුරාචාරය නො වළකා බලා හිඳිනාහු ද, ලෝකපාල ශබ්දය විනා ඒකාන්ත දේවතා කෙනෙක් මෙලොවෙහි නැත් ම ය' යි මුරගා දේවතාවන්ට යැදියාහ.

i. **අත්පා, බඳු** යන පදවල ව්‍යාකරණ ලක්ෂණ පහන්න.
ii. බිසව දුක් වන්නේ කවර හේතුවක් නිසා ද?
iii. බිසව උජ්ඣායනා කොට ප්‍රාර්ථනා කරන්නේ කුමක් ද?
iv. **උණ කිලිල්ලක් සේ, රාජසුඹුමාලයෝ ය, ලෝකාස්වාදරතියෙන්** යන පදවල අර්ථ දක්වන්න.

02. පහත දී ඇති පද්‍ය ඇසුරින් අසා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට වර්තමාන ලිඛිත බසින් ම පිළිතුරු සැපයිය යුතු යි.

(අ) අවා මඟ අවරණ අයෙක් මිසදිටු ගත්
සිදු කරන සැප අපමණ නොයෙක් කවි නළු රස දත්
ඉගෙන ගෙන එළු බණ පෙර තමතමනු ගත්
කියත් සමහරු බුදුන්ගේ ගුණ රාම සීතා කතා තෙපලත්

සමහරු උදාරා වෙන වෙන ම පැසී
උනුනට වෙමින් වාරා කියමින් උනුන් වාසී
බසින් බස සාරා සමහරු සිනා සී
කියත් සිත් නාමපද තෝරා කියති සිවුපද දෙපද රාසී

i. මෙහි සඳහන් කවි කුමන අවස්ථාවක් හා සබැඳේ ද?
ii. රාම සීතා කතා පවසන්නෝ කුමන පුද්ගලයෝ ද?
iii. සමහරු උදාරා ලෙස කුමක් කෙරෙත් ද?
iv. **අවා මඟ, උදාරා, සිත් නාම, වාසී** යන පදවල අර්ථ දක්වන්න.

(ආ) දිලිහෙන ගඟුලැලී ය ඇද හැලී ය
ගිලි මල් රොන'වුලී ය සුදු වැලී ය
මද මත් හස කැලී ය වන විලී ය
දැක යව මනකලී ය වන මලී ය

අතු අතිනැ'ද ගසා ය තුරු රුසා ය
කෙළන පන්දු ලෙසා ය සහතොසා ය
පැන ගෙන වන හිසා ය මඟ අසා ය
යන වඳුරන් නිසා ය නො ව ලසා ය

i. ගසින් ගසට පැන යන වඳුරන් කවියා දකින්නේ කෙසේ ද?
ii. ගිරවාට දැක බලාගෙන යන්නට පවසන්නේ මොනවා ද?
iii. මෙහි එන උපමාවක් හා රූපකයක් උපුටා දක්වන්න.
iv. **නො ව ලසා ය, ගිලිමල් රොන'වුලී ය, මදමත් හස කැලී ය** යන පදවල අර්ථ දක්වන්න.

03. පහත සඳහන් උද්ධෘතයන් සඳහා **අවස්ථා සම්බන්ධය** ලියන්න.

i. 'ඒ මිනිය දක්නා පිණිස වැඩිය මැනව'
ii. 'ඒ වරය මා කැමති විටෙක ඇර ගනිමි'
iii. 'අනේ ඔබගේ ආනුභාවයක් බලවත් නියා ය'
iv. 'මොවුන් ඇර අනික් මනුෂ්‍ය ස්ත්‍රියක තබා දිව්‍ය ස්ත්‍රියක පාවා දුන ද මගේ මනෝරථය පිරෙන්නේ නො වෙයි.'

04. දී ඇති වරණ අතුරින් **වඩාත් නිවැරදි වරණය** තෝරා යටින් ඉරක් අඳින්න.

1. **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය** තෝරන්න.
   i. කැලණි නදී තොමෝ දුරුතු පෝදා විචිත්‍ර ලෙස බැබළුණහ.
   ii. මහිලා සමිතියට නව සභාපතිනියක පත් වූවා ය.
   iii. මෙවර ලෝක කුසලානය ශ්‍රී ලංකාව දිනා ගනිති' යි ඇතැම්හු පවසති.
   iv. බොළඳ ටෙලිනාට්‍ය නිසා සමාජ හර පද්ධතිය විනාශ වෙති.
   v. මා විසින් සැම විට දක්ෂයන් ඇගයමි.

2. **අනුක්ත පදයක් නො මැති** වරණය තෝරන්න.
   i. මිනිසෙකු, වඳුරන්, ගවයෝ, පූජකයන්
   ii. ගංගාවෝ, තාරකාවෝ, රියදුරෝ, ගුරුවරු
   iii. කාන්තාවක, ගුරුවරයන්, පුස්තකයන්, යානාවෝ
   iv. වෘක්ෂයෝ, ගිරවුන්, මා, අපි
   v. නුඹ, තෝ, තා, තොපි

3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි වරණය තෝරන්න.

i. මරුටි, ටොයොටා, මැස්ඩා, ටාටා, නිශාන්, හොණ්ඩා
ii. ටොයොටා, ටාටා, මැස්ඩා, මරුටි, නිෂාන්, හොණ්ඩා
iii. ටාටා, ටොයොටා, නිෂාන්, මැස්ඩා, මරුටි, හොණ්ඩා
iv. ටොයොටා, ටාටා, නිෂාන්, මරුටි, මැස්ඩා, හොණ්ඩා
v. ටාටා, ටොයොටා, නිෂාන්, මරුටි, මැස්ඩා, හොණ්ඩා

4. අක්ෂර වින්‍යාසය නිවැරදි වරණය තෝරන්න.

i. උකුණා, උණහපුළුවා, එළදෙන, කංකුන්ඩා, කකුලුවා
ii. කරනවැමියා, කාලකණ්ණියා, කාලගෝළ, කුම්භාණ්ඩයා, කුරුමිනියා
iii. කුළුගෙඩිය, කෝණමානය, ගිනිහුළ, දැළිපිහිය, නළාව
iv. නැබුලු, නිවාරන, නීවරණ, නේපත්‍ය, නෛයිර්යාණික
v. පනිවුඩය, පබලු, පරිනත, පරිබ්‍රමණ, පළතුරු

5. උච්චාරණ ලක්ෂණ අනුව ද්විජ සන්ධ්‍යාක්ෂර යනුවෙන් හැඳින්වෙන අක්ෂර පමණක් ඇතුළත් තෝරන්න.

i. අ, ඉ, උ    ii. එ, ඒ, ඓ    iii. ඔ, ඕ, ඖ    iv. ඒ, ඓ    v. ඓ, ඖ

6. 'යව්' ආදි අව්‍යය සමාසය 'කු' ආදි අව්‍යය සමාසය 'ප' ආදි අව්‍යය සමාසය හා 'න' ආදි අව්‍යය සමාස යන අව්‍යය සමාසයන්හි එන ප්‍රභේද හතරට නිදර්ශන පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

i. කුප්‍රකට, අනුබල, ප්‍රබල, අපමණ
ii. අනිටු, උපගුරු, දුෂ්චරිත, අනුනායක
iii. අනුගාමී, සුමිහිරි, ප්‍රධාන, අනාචාර
iv. උපගම, අනිටු, දුසිරිත්, යව්දිවි
v. සුසිරිත්, අනුගමනය, පවර, අනූන

7. නිපාත යෝගයෙහි අවධි විභක්තියට නිදර්ශනයක් රහිත වරණය තෝරන්න.

i. ගාල්ල සිට මාතර දක්වා වෙරළ සුන්දර ය.
ii. භික්ෂූන් කෙරෙන් මහ නා හිමියෝ අබිමන් ලබති.
iii. මුහුදින් සුළං හමයි.
iv. සංචාරකයෝ රටින් පිට ව යති.
v. පියදාස ගසෙන් වැටී ඔත්පළ විය.

8. උපසර්ගයක් යෙදී නැති වරණය තෝරන්න.

i. සබඳ, සසල, සලකුණු, සපුරන, සදොස්
ii. දුදන, දුගඳ, දුසිරිත්, දුබල, දුර
iii. විමල්, විදෙස්, වියෝ, විමුතු, විලස්
iv. අසරණ, අයැදුම, අගුණ, අදර, අදෙස්
v. උගත්, උදුළ, උගෙන, උපත්, උදම්

9. පුරුෂවාචී ප්‍රකෘතියකට ස්ත්‍රීවාචී ප්‍රකෘතියක් යෙදී ස්ත්‍රී ලිංග පදයක් නිර්මාණ වී ඇති වරණය තෝරන්න.

i. සෙබළ ලිය    ii. අධ්‍යක්ෂිකා    iii. ගැහැනු ළමයා
iv. මාගම් සඟුන්    v. ගැටිස්සී

10. විරුද්ධාර්ථයක් රහිත පදයක් ඇතුළත් වරණය තෝරන්න.

i. ආකාර - විකාර, ඒකල - සමූහ
ii. නිපුණ - ආධුනික, ස්වතන්ත්‍ර - පරතන්ත්‍ර
iii. ඌන - නූන, උන්නතිය - අවනතිය
iv. අල්පේච්ඡ - මහේච්ඡ, උච්ච - නීච
v. සුදන - දුදන, රෝගී - නිරෝගී

11. නිරුත්සාහක ක්‍රියාවක් සහිත වරණය තෝරන්න.

i. ගීත ඇසෙන විට ළමයා නැටවෙයි.
ii. බල්ලා බිරුවේ ය.
iii. ගොවියා කුඹුර වපුරයි.
iv. දැරිය ගයමින් නටයි.
v. පාඩම් කළොත් විභාගය සමත් වේ.

12. සෑම පදයක ම 'ඇදය' (පිල්ලම) යෙදී ඇති වරණය තෝරන්න.

i. නැයෝ, රුවල, මිතුරු, කෑදර
ii. රැය, පැය, දැය, රැකියාව
iii. රුවන්, දැසමන්, කැලය, කැවිඩි
iv. ගැල, ටැඹ, සෑය, කෑම
v. කැම, නැව, ළැම, ඇණු

13. **තද්ධිත පදයක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.

i. නාමික, ප්‍රාථමික, කාර්මික, නාගරික ii. භෞතික, දෛනික, නෛතික, පෞද්ගලික
iii. මාධුර්ය, චාතුර්ය, මුදුතා, අවශ්‍යතා iv. සත්ත්ව, කිතුනු, නිහැඬියා, මැඬියා
v. දේශීය, කනිෂ්ඨ, රණකාමී, සංගීතඥ

14. **සහාර්ථයේ හෙවත් සම්බන්ධාර්ථයේ නිපාතයක් සහිත** පිළිතුර තෝරන්න.

i. ඒ ගෙදර හොල්මන් තියෙනවා ලු. ii. මා ද කැටුව යන මැනව, ස්වාමීනි.
iii. එයාට ගමට මුහුණ දෙන්න බැහැ. iv. සියලු සැප හැරපියා වලට වැද බවුන් වඩමි.
v. වැස්සේ තෙමීම නිසා මම අසනීප වීමි.

15. **අනතීත කාල කර්මකාරක කෘදන්තයක් ඇතුළත්** වරණය තෝරන්න.

i. හැඬෙනා ii. නැමුණු iii. ගැයුම් iv. බැලුණ v. රැඟුම්

16. **නිවැරදි පද බෙදීම් සහිත** වරණය තෝරන්න.

i. වලාවෝ අහස් හි ඇතට පා වී ගියෝ ය.
ii. වාක්‍යයක උක්ත කර්තෘවිසින් කරනු ලබන බව හැඟවෙන්නේ කර්තෘකාරක ක්‍රියා යි.
iii. දරුවෝ සතුටින් සෙල්ලම් කළෝ ය.
iv. මුදලාලි කොලුවාලවා බඩු ගෙන්ව යි.
v. මම ගොයම් නෙළද්දී වැස්සටතෙමුණෙමි.

17. **ස්වරාදේශයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.

i. චූලෝදර, මහේශ්වර ii. මහෝදර, අරුණෝදය
iii. අල්පේච්ඡ, ධනේශ්වර iv. ග්‍රාමෝදය, යථෝක්ත
v. ජීවිතේන්ද්‍රිය, අග්‍රාමාත්‍ය

18. **සමානාර්ථයක් නො දෙන** වරණය තෝරන්න.

i. පියයුරු - පයෝධර ii. සිලිලාර - සරසි iii. සකි - සබඳ
iv. කනක - මැණික v. වෙණු - උවිඳු

19. **තත්සම පදයක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.

i. ගජ, දින, අමර ii. මරණ, මුණි, ගිරි iii. කාර්, බස්, ෂර්ට්
iv. අම්මා, අප්පා, අක්කා v. සඳ, ධම්, චිත්ත

20. **සාවද්‍ය වරණය සහිත** පිළිතුර තෝරන්න.

i. කනිපින්දම් - දුක්ගැනවිලි ii. පාරට්ටුව - වර්ණනාව
iii. හෙයියම්මාරුව - අධික සතුට iv. අඳෝ සංසාරයක් - යාන්තමින් වත්
v. හුඹස් බිය - බොරු බිය

05. I. **පහත දැක්වෙන තද්ධිත පදවල ප්‍රකෘති ප්‍රත්‍ය වෙන් කරන්න.**

i. දූරි ii. මැදිරි iii. බිබිළි iv. ප්‍රතාපවත් v. ධීමත්
vi. ගොරතර vii. ශ්‍රේෂ්ඨතම viii. කැඳිති ix. කළටි x. වකුටු

II. **පහත සඳහන් පදවල ප්‍රකෘති ප්‍රත්‍ය එක් කොට ගළපා ලියන්න.**

i. ජනපද + ඉක ii. ලෝක + ඉක iii. මණ්ඩල + ඉක iv. ශිෂ්‍ය + ත්ව
v. මධුර + ය vi. මත්සර + ය vii. ශ්‍ර + ඉෂ්ඨ viii. ප්‍රදේශ + ඊය
ix. ලංකා + ඊය x. අද + තන

III. **පහත සඳහන් තද්ධිත ප්‍රත්‍ය යෙදුණු තද්ධිත පදය බැගින් ලියන්න.**

ර, ක, තීය, තා, ඊන, ආ, අළ, අක්, අණි, බ

IV. **පහත සඳහන් කෘදන්ත පදවල ප්‍රකෘති ප්‍රත්‍ය වෙන් කරන්න.**

නටන, කපනු, දුවනා, බැලු, රැකි

V. **ඉලි, මන්, උම්, නු, ඊම් යන ප්‍රත්‍ය යොදා කෘදන්ත පද දෙක බැගින් ලියන්න.**